# සාමාන්‍ය සමයේ දසතුන්වන සතිය
# සිකුරාදා

## පළමුවන කියැවීම

උත්පත්ති පොතෙන් ගත් පාඨයෙකි.

උත්පත්ති 23: 1-4, 19: 24: 1-8, 62-67

"සිය මවගේ මරණයෙන් ඊසාක්ට ඇති වූ දුක රෙබෙකා
පාවා ගැනීමෙන් තුනී විය."

සාරා අවුරුදු එකසිය විසි පහක් ආයු වළඳා කානාන් දේශයේ හෙබ්‍රොන් හෙවත් කිර්යත්-ආර්බාහි දී අපවත් වූවාය. ආබ්‍රහම් ඈ ගැන හඬා වැළපුණේය. පසුව ඔහු ඇයගේ මළ සිරුර ළඟින් නැඟිට, හිත්තිවරුන්ට කතා කොට, "මම ඔබ සමඟ ටික කලකට වාසය කරන විදේශිකයෙක් වෙමි. මාගේ භාර්යාවගේ මළ සිරුර ගෙන ගොස් වැළලීම පිණිස මට ම උරුම වන ලෙස සොහොන් පොළක් මට දෙන්නැ"යි කීවේය.

පසුව ආබ්‍රහම් කානාන් දේශයේ හෙබ්‍රොන් හි මම්රේ ඉදිරියෙහි වූ මක්පේලාවෙහි ඉඩමේ තිබූ ගුහාවෙහි සිය බිරිඳ වන සාරා භූමදාන කළේය.

ආබ්‍රහම් වයස්ගත මහල්ලෙක් විය. සමිඳාණන් වහන්සේ ද හැම අතින් ම ඔහුට ආශිර්වාද කොට තිබිණි. ඔහු තමා සතු සියල්ල බලා හදාගත් තිවසේ දටු මෙහෙකරුවාට කතා කොට, "කරුණාකර මාගේ කලවය යට තුඹ අත තබන්න. මා පදිංචි වී සිටින කානාන් දේශයේ කාන්තාවන් අතුරින් භාර්යාවක මාගේ පුත්‍රයාට තුඹ තෝරා නොගන්නා ලෙසත්, මාගේ රටට, මාගේ ඥාතීන් අතරට තුඹ ගොස් මා පුත් ඊසාක්ට භාර්යාවක ගන්නා ලෙසත්, ස්වර්ගයේ දෙවියන් වහන්සේ ද පොළොවේ දෙවියන් වහන්සේ ද

වන සමිඳාණන් වහන්සේගේ නාමයෙන් මම තුඹ දිවුරවමි"යි කීවේය. මෙහෙකරුවා එවිට ඔහුට කියනුයේ "සමහරවිට ඒ කාන්තාව මා සමග මේ රටට ඒමට අකමැති වන්නට පුළුවන. එසේ වුවහොත් ඔබ තික්ම ආ රටට ම, මා ඔබේ පුත්‍රයා ගෙන යුතුදැ"යි ඇසීය.

ආබ්‍රහම් උත්තර දෙමින් "මාගේ පුතා නම් නැවත එහි නොගෙන යැමට තරයේ සිතට ගන්න. මාගේ පියාගේ ගෘහයෙන් ද මාගේ ඥාතීන්ගේ දේශයන්ද මා ගෙනා, මට දිවුරා වදාළ ස්වර්ගයෙහි දෙවි සමිඳාණන් වහන්සේ මේ රට තුඹේ පෙළපතට දෙන්නෙමි. තුඹට පෙරටුව උන් වහන්සේ සිය දූතයා යවන සේක. තුඹ ඒ රටින් මාගේ පුත්‍රයාට භාර්යාවක ගත යුතු යැ"යි මට වදාළ සේක. තුඹ කැටුව ඒමට ඒ කාන්තාව අකැමැති වුවහොත් මා ඉදිරියෙහි දුන් දිවුරුමෙන් ඔබ නිදහස් ය. එහෙත් තුඹ මා පුත්‍රයා නම් එහි යළි නොගෙන යා යුතු"යි කීවේය.

එකල නේගේබ් ප්‍රදේශයෙහි පදිංචි වී සිටි ඊසාක් ලහයි-රොයි නම් ස්ථානයේ ළිඳ අසල පාළුකරයට පැමිණ සිටියේය. ඉර බැස යද්දී ඔහු කෙතෙහි ඇවිදිමින් හිස ඔසවා බලන විට ඔටුවන් එනු දුටුවේ ය. රෙබෙකා ද හිස ඔසවා බලන විට ඊසාක් දුටුවා ය. එවිට ඈ ඔටුවා පිටින් බැස මෙහෙකරුවා අමතා "අප හමුවීමට කෙතෙහි සිට ඇවිද ගෙන එන මේ මිනිසා කවරෙක් දැ"යි විචාළා ය. ඔහු ද පිළිතුරු දෙමින් "ඒ මාගේ ස්වාමියා ය"යි කීය. එවිට ඈ සළුවගෙන මුහුණ වසා ගත්තාය. මෙහෙකරුවා තමා කළ සියල්ල ඊසාක්ට පැවසීය. ඊසාක් ද රෙබෙකා තම මවගේ කූඩාරමට ගෙනැවිත්, ඇය සරණ පාවා ගත්තේය. ඈ ඔහුගේ බිරිඳ වූවාය. ඔහු ඇයට ප්‍රේම කළේය. මෙලෙස ඊසාක් තම මවගේ මරණින් පසු සැනසීමට පත් විය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 106: 1–5

පිළිතුර: සමිඳාණන්ට තුති පුදන්න. මන්ද, එතුමාණෝ යහපත්ය.

ගීය:

සමිඳුන් පසසන්න. සමිඳුන්ට තුති පුදන්න. මන්ද, එතුමාණෝ යහපත් ය. එතුමන්ගේ තිර පෙම සදහට ම පවතින්නේය. සමිඳුන්ගේ ප්‍රබල ක්‍රියා කියන්නත්, එතුමන්ගේ සියලු පැසසුම් ගයන්නත් පුළුවන් කවරෙකුට ද?

යුක්තිය රක්නා අය ද හැම කල්හි දැහැමි ක්‍රියා කරන අය ද භාග්‍යවන්තයෝ ය. සමිඳුනි, ඔබේ සෙනඟට කරුණාව දක්වන විට මා සිහිකළ මැනව. ඔවුන් ගළවන විට මට උපකාර කළ මැනව.

ඔබේ තෝරාගත් සෙනඟගේ ශුභ සිද්ධිය දකින්නත් ඔබට අයිති අය සමඟ ජය ගී ගයන්නත්, ඔබේ උරුමයෙන් මහිමය ලන්නත් මට ඉඩ දුන මැනව.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, ඔබේ මාවත් මට පැහැදිලි කළ මැනව.
ඔබේ සත්‍යය අනුව මා ගෙන ගිය මැනව.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
මා ආයේ දමිටුන් නොව පව්ටුන් කැඳවීමට යයි ස්වාමින් වහන්සේ වදාළ සේක.
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 9: 9-13

"රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදෙකුගෙන් වැඩක් නැත."

ජේසුස් වහන්සේ සිය නුවරින් යද්දී රේගු පොළේ හුන් මතෙව් නම් මිනිසෙකු දැක, "මා අනුව එන්නැ"යි ඔහුට වදාළ සේක. ඔහු නැගිට උන්වහන්සේ අනුව ගියේය.

තවද, ජේසුස් වහන්සේ ඔහුගේ නිවසෙහි වැඩහුන් කල, බොහෝ අයකැමියෝ ද පව්කාරයෝ ද අවුත් උන්වහන්සේ හා ශ්‍රාවකයන් සමඟ හිඳගත්හ. පරිසිවරු ඒ දැක, "ඔබේ ඇදුරුතුමා අයකැමියන් ද පව්කාරයන් ද සමඟ කෑම කන්නේ මන්දැ"යි උන්වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් ඇසූහ. උන්වහන්සේ ඒ අසා ඔවුන්ට කතා කොට, "රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදෙකුගෙන් වැඩක් නැත. මම යාග පූජාවට නොව දයාවට කැමැත්තෙමි"යි යන කීමේ අර්ථය ඔබ ගොස් තේරුම් ගන්න. මා ආයේ දමිටුන් නොව පව්ටුන් කැඳවීමට ය"යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.